මාධ්‍ය නිවේදන අංක 07

## මැතිවරණ කොමිෂන් සභාව

**2021.02.25 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

- 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත ප්‍රකාරව පිළිගත් දේශපාලන පක්ෂ විසින් 2019 වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතුව තිබෙන විගණන වාර්තා මැතිවරණ කොමිෂන් සභාව වෙත මෙතෙක් ඉදිරිපත් නොකිරීම හා / හෝ සපුරාලිය යුතු සෙසු අවශ්‍යතා සම්පූර්ණ කොට නොමැති දේශපාලන පක්ෂ පිළිබඳව පරීක්ෂා කර බලා එම පක්ෂවල පිළිගැනීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කොට ඇත.

- යම් යම් හේතු සාධක මත දේශපාලන පක්ෂ විසින් පළාත් පාලන ආයතනවලින් ඉවත් කළ සභිකයින් එකී ඉවත් කිරීමට එරෙහිව අධිකරණ නියෝගයක් ලබාගෙන නොමැත්තේ නම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 අධිකාරිය) ප්‍රකාරව ඔවුන් සභික ධුරවලින් ඉවත් කළ යුතුව පවතින හෙයින්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරන ලෙස අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දීමට තීරණය කරන ලදී.

- ජනාධිපතිවරණ ඡන්ද විමසීම, පාර්ලිමේන්තු ඡන්ද විමසීම හා පළාත් සභා ඡන්ද විමසීම සඳහා දැනට පවත්නා ඇප තැන්පත් මුදල් ප්‍රමාණය සංශෝධනය කිරීමටත් සහ ඡන්ද විමසීමක් සඳහා ස්වාධීනව තරග කරන අපේක්ෂකයන්ට පමණක් ඇප තැන්පත් කළ යුතු බවට දැනට පවත්නා විධි විධාන සංශෝධනය කිරීමත් එකී විධි විධාන ස්වාධීනව තරග කරන අපේක්ෂකයන්ට පමණක් සීමා නොකොට පිළිගත් දේශපාලන පක්ෂවලින් තරග කරනු ලබන අපේක්ෂකයන්ට ද එකී අවශ්‍යතාව වලංගු කිරීම සඳහා එම පනත්වලට කරන ලද සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ජනාධිපති ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.03.01